කරුණු පළ කරයි. ගෘහනිර්මාණ ශිල්පය අතින් සෞභාග්‍යමත් යුගයක අසිරිය කියා පෑ පොළොන්නරු යුගය සාහිත්‍යධරයන්ට ද අසිරිමත් යුගයක් උදා කළේය. බාහිර බලවේග මගින් සිදු වූ බලපෑම් අබියස වුව පොළොන්නරු සාහිත්‍ය කරුවන් අතින් වැදගත් ග්‍රන්ථ රචනා වීම අප රටේ අතීත සෞභාග්‍යය කියා පෑමට බෙහෙවින් උපකාරී වන සාධකයකි. පොළොන්නරු අවදියෙහි විසූ සාහිත්‍ය කරුවන් සිංහල බෞද්ධ සාහිත්‍යයකට පදනම දැමීම ද විශේෂ වූ කරුණක් ලෙස දක්වන්නට කතු හිමියන් යොමු වී ඇති බව පෙනේ.

අමාවතුර කතුවර ගුරුළුගෝමීන් හා බුත්සරණ කර්තෘ විද්‍යාචක්‍රවර්තීන් බුදු ගුණ කියා පෑම දෙ-වැදෑරුම් ආකාරයකින් ඉටු කර ඇත. පූජ්‍ය සිරිසුමන හිමියන් පවසන අන්දමට, අමාවතුර කළ ගුරුළුගෝමීන් සිය කෘතිය මගින් මානුෂීය බුදුවරයකු ගොඩගන්නට ඉතා පැහැදිලි ප්‍රතිපත්තියක පිහිටා ක්‍රියා කළ අයුරු පෙනේ. සිය කෘතියෙහි මුල සිට අග දක්වාම, " පුරිසදම්මසාරථී ගුණය" නූල් පටක් සේ දිවෙන අන්දමට එකම සන්දර්භයක පිහිටා රචනා කිරීමට ගෙන ඇති සාර්ථක ප්‍රයත්නය විමසුම් ධාරා කෘතිය මගින් විග්‍රහයට ලක් කර ඇත. අනික් අතට බුත්සරණ කතුවරයා එම කටයුත්ත සිදු කළේ ඊට හාත්පසින්ම වෙනස් ආකාරයකිනි. එනම්, හුදෙක් දමන කතා පමණක් උපයෝගී කරගැනීම වෙනුවට චරිත කථා, ජාතක කථා, බුදුගුණ වැනුම් වැනි විවිධාකාර දේ ඔස්සේය. නාලාගිරි දමනය රසවත් ලෙස වර්ණනා කරන බුත්සරණ කතුවරයා, එම මත් ඇතා දමනය කිරීමට බුදු හිමියන් ක්‍රියා කළ ආකාරය බිහිසුණු ජවනිකාවක් ප්‍රේක්ෂකයන් ඉදිරියේ මවා පාන්නාක් මෙන්, ජීවමානව රංගනයක් මගින් ඉදිරිපත් කරන ආකාරයෙනි.

"ඈත ධූලීන් වැසී ගිය ඇත් රජය. මෑත සවණක් ගණ බුදු රැසින් සැදී ගිය බුදුරජාණෝය. ඈත එබු එබූ පයින් පොළව පලා පියන්නා සේ දිවෙන ඇත් රජය. මෑත .......... මිහිකත සනහ සනහා වඩනා බුදුරජා ණෝය."
(බුත්සරණ)

මේ අයුරින් පෙර සාහිත්‍ය කරුවන් සිය නිර්මාණශීලී ගුණය හා කවිත්වය මගින් චමත්කා-රජනක දර්ශන මවා පාමින් සාහිත්‍ය කෘති රචනා කළ ආකාරයට පොළොන්නරු යුගයේ රචිත කෘති කිහිපයක් සාක්ෂි දරයි. පොළොන්නරු අවදියේදී රචිත නිර්මාණ මගින්ම, සාහිත්‍ය කරුවන්ගේ ක්ෂේමභූමිය බවට බුදුසිරිතත් ජාතක කතාවත් පත් වූ අයුරු කතු හිමියන් මැනවින් විග්‍රහ කර දක්වා ඇත. එමෙන්ම ගුරුළුගෝමී වැනි ලේඛකයකු, ඕජස, ප්‍රසාදය, ශ්ලේෂය, සමතාව, සමාධිය, මාධූර්යය, සුකුමාරතාව, උදාරතාව, අර්ථව්‍යක්තිය සහ කාන්තිය යනුවෙන්, වාමන නමැති සකු අලංකාරවාදියා ගද්‍ය රචනයක පැවතිය යුතු ගුණ ලෙස හඳුන්වා දී ඇති ලක්ෂණවලින් තම සාහිත්‍ය රචනා සමන්විත කරවීමට සමත් වී ඇති ආකාරය ද 'විමසුම් ධාරා' කෘතියෙහි කතු හිමියන් පැහැදිලි කර දී ඇති අයුරු ඉතා වැදගත්ය.

ජාතක කථා විෂය කරගත් පැරණි සාහිත්‍ය රචනා වැඩි වශයෙන් ආගමික නැඹුරුවකට යොමු වූ නමුදු මෙරට සම්භාව්‍ය සාහිත්‍යයේ ප්‍රේමකාව්‍ය ලක්ෂණ ද අඩංගු වන බව ලේඛක හිමිපාණන් සිය අවධානයට ලක් කොටගෙන ඇත. "සම්භාව්‍ය සාහිත්‍යයේ විශිෂ්ට ප්‍රේම කාව්‍යය" සුළුකලිඟුවත" යනුවෙන් විසිඑක් වන පරිච්ඡේදය නම් කරමින් ඒ ගැන කර ඇති විග්‍රහයෙන් මෙම කරුණ සාක්ෂාත් කොටගෙන තිබෙන අයුරු අපූරුය. ආදරය, ප්‍රේමය, විරහ යන මෙම හැඟීම් මෙහි එන කථා වස්තුවෙන් මතු කර දක්වා ඇත. ගු-රුළුගෝමී පඬිවරයා විසින් නිර්මිත ධර්මප්‍රදීපිකා නම් අගනා සාහිත්‍ය කෘතියෙහි විවරණය කෙරෙන අපූර්ව ප්‍රේමකථාව 'සුළුකලිඟුදාවත' බව විවාදයෙන් තොරව පිළිගත හැක්කකි. සිළුකලිඟු කුමරා මාලිගයෙන් නික්ම ගිය තැන් පටන් වනයට පිවිස තාපස දිවිය අරඹන අවස්ථාව දක්වා ගුරුළුගෝමීන් කර ඇති වර්ණනාව විරහ වේදනාව සැබෑ සංවේදී ගුණයෙන් යුතු-ව නිරූපණය කරන්නකි. මනහර උපමා ආදිය යොදාගනිමින් මෙම වැණුම් රසගන්වන්නට කතුවරයා සමත් වී ඇති ආකාරය පූජ්‍ය සිරිසුමන හිමියන් තව දුරටත් රසගන්වමින් සිය කෘතියෙන් ඉදිරිපත් කර ඇති ආකාරය අපූරුය.

ආගමික කරුණු, සංස්කෘතික ලක්ෂණ මෙන්ම සමාජ විෂමතා ආදිය මතු වෙමින් එන ආකාරය ද යන මේ සමස්තය පැරණි සාහිත්‍යය පුරාම විවරණය වන ආකා-රය විමසුම් ධාරා ග්‍රන්ථයෙන් එළි පෙහෙළි කර ලන්නට මහාචාර්ය අගලකඩ සිරිසුමන හිමියන් ගෙන ඇති වෙහෙස අපගේ ඇගයීමට ලක් විය යුතු වෙයි. තවද, සම්භාව්‍ය සාහිත්‍යයේ දිදුලන ආලෝකය පාඨක, රසික දෙකොට්ඨාසයට මතු නොව විචාරක පිරිසට ද එමගින් සාක්ෂාත් කරගැනීම සඳහා ඔවුන්ට කෙරෙන මහඟු උපකාරයක් ලෙස ද මෙම කෘතිය සැලකිය හැකිය.

---

## <u>ආරාධනයයි</u>

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කොන්සල් ජනරාල් කාර්යාලය, මෙල්බර්න්හි ශ්‍රී ලාංකික ප්‍රජා සංවිධාන හා සමග සංවිධානය කරනු ලබන

**ශ්‍රී ලංකාවේ හැට හත් වැනි නිදහස් දින සංවත්සරය සැමරීමේ උත්සවය**

***2015 පෙබරවාරි මස 04 වැනි බදාදා***
***පස්වරු 7.00 සිට 9.30 දක්වා***

***වික්ටෝරියාවේ, වොන්ටර්නා සවුත්, කැතීස් ලේන්හි අංක 90 දරණ ස්ථානයේ පිහිටි***
*'ද ග්‍රෑන්ඩ් ' ශාලාවේදී* පැවැත්වේ.

**එයට සහභාගිවන ලෙස ඔබ සැමට කෙරෙන සුහද ආරාධනයයි.**

**කොන්සල් ජනරාල්**
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කොන්සල් ජනරාල් කාර්යාලය
අංක 1, ක්වීන්ස් පාර, මෙල්බර්න්, වික්ටෝරියා 3004

විමසීම: දුරකතන අංක - 9290 4200

---


# IMMIGRATION LAW @
## Australian Immigration Law firm of the Sri Lankan Community

We are proud to have lead the way for others to follow...

**Professional Immigration Legal Services**
Legal Advice in simple to complex Immigration matters

- Skill Assessments
- State Sponsorships Expression of Interest (EOI)
- Visa Lodgments
- Employer Sponsorships & Nominations
- Migration Review Tribunal Appeals
- Federal Court Appeals
- Ministerial Appeals

General Skill Migration
457 Visas
Employer Nominated Migration
Student Visas
Graduate Skill Visas
Permanent Residence Pathways
Spouse Visas
Contributory Parent Visas
Business Migration
Resident Return Visas

A Team of Qualified & Experienced Lawyers & Registered Migration Agents



**Susantha Katugampala**
Principal
Barrister & Solicitor
Accredited Immigration Law Specialist
MARN: 9601070

LAW INSTITUTE OF VICTORIA ACCREDITED SPECIALIST

**FAIRFIELDS LAWYERS** | AUSTRALIA GATEWAY Australian Immigration Law Advisory

10 Morrison Place
East Melbourne 3002
Australia
T: 03 9650 4557
1300 888 331
M: 0417 851 041

Suite 602, Hilton Colombo
Residence 200
Union Place, Colombo 2
Sri Lanka
T: +94 11 2300 627
M:+94 777 347 670

info@fairfieldslawyers.com



*We Deliver Results...*